ජන හා නිවාස සංගණනය 2024
குடிசன, வீட்டுவசதிகள் தொகைமதிப்பு 2024
Census of Population and Housing 2024

# මූලික වාර්තාව ලැයිස්තුගත කිරීමේ අදියර
# நிரற்படுத்தும் கட்ட ஆரம்ப அறிக்கை
# Preliminary Report Listing Stage

මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැළසුම් සහ සංචාරක අමාත්‍යාංශය
நிதி, பொருளாதார அபிவிருத்தி, கொள்கை வகுத்தல், திட்டமிடல் மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
Ministry of Finance, Economic Development, Policy Formulation, Planning and Tourism

**ISBN 978-624-6350-93-2**

# පෙරවදන

ශ්‍රී ලංකාවේ පහළොස්වන ජන හා නිවාස සංගණනය 2024 වසරේදී පැවැත්වීමට නියමිතය. වසර කිහිපයක සැළසුම් කාය්‍යීයන් වලින් පසුව අදියර කිහිපයකින් සිදුකෙරෙන ජන හා නිවාස සංගණනයක දෙවන අදියර වන සියලුම ගොඩනැගිලි හඳුනාගනිමින් ඒවායේ පවතින සංගණන ඒකක අංක කර ලැයිස්තුගත කිරීම 2023 දෙසැම්බර් සිට 2024 ජනවාරි තෙක් සිදුකරන ලදී. අවුරුදු 150 ට අධික සංගණන ඉතිහාසයේ ප්‍රථම වරට මෙම තොරතුරු ටැබ්ලට් පරිගණක හරහා එක්රැස් කරනු ලබයි. ලැයිස්තුගත කිරීමේ අදියරේදී, සංගණනයේ පළවන අදියර වන සිතියම් සකස් කිරීමේ අදියරේ සකස්කරන ලද සංගණන කාණ්ඩ සිතියම් භාවිතා කරමින් ඒවා තුල පවතින සංගණන ඒකක හඳුනාගැනීම සිදුකරන ලදී. ඒ අනුව, ලැයිස්තුගත කිරීමේ නිලධාරීන් විසින් හඳුනාගත් සංගණන ඒකකවලට හඳුනාගැනීමේ අංක ඇතුලත් ලේබලයක් ලබාදෙමින් තොරතුරු රැස්කරන ලද අතර ටැබ්ලට් පරිගණකය භාවිතයෙන් ලබාගත් එම දත්ත ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ මධ්‍යගත සර්වරය වෙත උඩුගත කරනු ලැබීය. එසේ ලබාගත් දත්ත ආධාරයෙන් සංගණනයේ තෙවන අදියර වන ගණන්ගැනීමේ අදියරට අවශ්‍යවන දත්ත පද්ධතිය සකස්කරන ලදී.

වර්තමානයේදී, පරිපාලන කටයුතු සඳහා, ප්‍රතිපත්ති සම්පාදනයට හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු සඳහා යාවත්කාලීන වූ දත්තවලට ඇති ඉල්ලුම පෙරට වඩා දැඩිව පවතී. ඒ අනුව ගොඩනැගිලි හා ඒවායේ පවතින සංගණන ඒකක පිළිබඳ සංඛ්‍යාලේඛන සඳහා ඇති අධික ඉල්ලුමට පිළිතුරක් ලෙස ලැයිස්තුගත කිරීමේදී එක් රැස්කළ දත්ත පදනම් කරගෙන මෙම ප්‍රකාශනය සකස්කර ඇති අතර ශ්‍රී ලංකාව හා පරිපාලන දිස්ත්‍රික්ක විසිපහට අදාළ තොරතුරු මෙහි අඩංගු වේ.

සංගණනයක් යනු ඉතා සංකීර්ණ දත්ත රැස්කිරීමේ ක්‍රියාවලියක් වන අතර රටෙහි නිවාස හා ජනගහනය පිළිබඳ සංඛ්‍යාලේඛන පහලම පරිපාලන මට්ටමට ලබාදෙන එකම දත්ත මූලාශ්‍රය ද එය වෙයි. ඒ සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරින් , දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනය ඇතුළු විශාල රාජ්‍ය නිලධාරීන් පිරිසක් කටයුතු කරනු ලබයි. ඔවුන්ගේ නිබද කැපවීම සංගණනයේ සාර්ථකත්වට ප්‍රධානම හේතුවක්වන බව ගෞරවයෙන් සඳහන් කරමි.

ලැයිස්තුගත කිරීමේ අදියර සාර්ථකව නිම කිරිමට උද්යෝගයෙන් හා කැපවීමෙන් කටයුතු කළ ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට, දිස්ත්‍රික් ලේකම් ඇතුළු දිස්ත්‍රික් පරිපාලනය හා සියලු රජයේ හා අනෙකුත් ආයතනවල නිලධාරීන්ට මාගේ හෘදයාංගම ස්තූතිය පුදකරමි. එසේම, මෙම කාර්යයෙහි සාර්ථකත්වය සඳහා ඉතාමත් වැදගත් වන නිවැරදි තොරතුරු ලබාදෙමින් පූර්ණ සහයෝගය ලබාදුන් මහජනතාව වෙතද මාගේ කෘතඥතාවය පළ කරමි.

ඉදිරි සංගණන කාය්‍යීන් සඳහා ද සියළු පාර්ශවකරුවන්ගේ පූර්ණ සහය බලාපොරොත්තු වෙන අතර මෙම වාර්තාවේ ඇතුලත් සංඛ්‍යාලේඛන ප්‍රතිපත්ති හා සැළසුම් සකස් කිරීම ඇතුළු විශ්ලේෂණ කායීයන් සඳහා මහගු පිටුවහලක්වනු ඇතැයි හුදෙක් බලාපොරොත්තු වෙමි.

ඩී.ඩී.ජී.ඒ. සෙනවිරත්න

සංගණන අධිකාරි හා

අධ්‍යක්ෂ ජනරාල්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

306/71, පොල්දූව පාර,

බත්තරමුල්ල.

2024.10.01

# හැඳින්වීම

## පසුබිම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සෑම වසර දහයකටම වරක් පවත්වනු ලබන ශ්‍රී ලංකාවේ ජන හා නිවාස සංගණනය රටෙහි ප්‍රධානතම ජනවිකාශ තක්සේරුව වෙයි. මෙම පුළුල් ජාතික කර්තව්‍යයේ අරමුණ රටෙහි ජීවත්වන ජනගහනයේ ප්‍රමාණය, සංයුතිය පිළිබඳ සංඛ්‍යාලේඛන ලබාදීම සහ එමගින් රටෙහි සමාජ-ආර්ථික පැතිකඩයන් පිළිබඳව විස්තරාත්මක තොරතුරු ලබා දීමයි. ජන හා නිවාස සංගණනයකදී, ප්‍රජාවිද්‍යාත්මක ලක්ෂණයන්, අධ්‍යාපන මට්ටම්, සෞඛ්‍ය තත්ත්වයන් සහ ජීවන තත්වයන් ඇතුළු ජනගහනය සහ නිවාස පිළිබඳ තොරතුරු රාශියක් රැස්කෙරේ. සංගණනය මගින් ප්‍රකාශයට පත්කරනු ලබන මෙම සංඛ්‍යාලේඛන ප්‍රතිපත්ති සම්පාදකයින්, පර්යේෂකයින් සහ සැලසුම්කරුවන් සඳහා අත්‍යවශ්‍ය වන අතර, මෙමගින් ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් වැදගත් තීරණ ගැනීමේ සහ උපායමාර්ගික සංවර්ධනය සඳහා අවශ්‍ය තොරතුරු සපයනු ලබයි. තවද, ජන හා නිවාස සංගණනයක් පැවැත්වීමේ දී සංගණනයන් පිළිබඳ ජාත්‍යන්තරව භාවිත කරනු ලබන මාර්ගෝපදේශයන් සහ නිර්දේශයන් භාවිත කරනු ලබන අතර එමඟින් රටෙහි ජනගහනය පිළිබඳව ජාත්‍යන්තරව සැසඳිය හැකි සංඛ්‍යාලේඛන ලබාදීමට හැකිවේ.

## ජන හා නිවාස සංගණනය 2024

එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශයන්ට[1] අනුව, කිසිදු පුද්ගලයෙකු හෝ නිවාසයක් මග නොහැරෙන ලෙසත්, දෙවරක් ගණන් නොගැනෙන ලෙසත් නිවැරදිව ගණන් ගැනීම සිදුකරන බවට සහතික වීම සංගණනයක අත්‍යවශ්‍ය ලක්ෂණයක් වේ. එබැවින්, මෙම අත්‍යවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා ජන හා නිවාස සංගණනයක් ප්‍රධාන අදියර හතරකින් පවත්වනු ලැබේ. ජන හා නිවාස සංගණනයෙහි පළමු අදියර ලෙස, රටේ කුඩාම පරිපාලන කොට්ඨාශය වන ග්‍රාම නිලධාරී කොට්ඨාස, ගණන් ගැනීමේ ප්‍රදේශ හෝ සංගණන කාණ්ඩ ලෙස හැඳින්වෙන කුඩා කොටස් වලට බෙදා වෙන්කරන ලදී. කිසිදු ප්‍රදේශයක් මග නොහැරීම හෝ දෙවරක් ගණන් නොගැනීම සහතික කිරීම සඳහා සංගණන කාණ්ඩ මායිම් ඉතා ප්‍රවේශමෙන් සකසකර සිතියම් සකසකරන ලදී. සංගණන කාණ්ඩ සිතියම් සකස් කිරීමේ අදියර ලෙස හැඳින්වෙන මෙම ක්‍රියාවලිය 2016 සිට 2020 දක්වා සාර්ථකව සිදු කරන ලදී. එසේ සකස් කළ සංගණන කාණ්ඩ සිතියම මත පදනම්ව රටේ පවතින සියලුම ගොඩනැගිලි ලැයිස්තුගත කිරීමේ දෙවන අදියර 2023 ඔක්තෝබර් සිට 2024 ජනවාරි දක්වා සාර්ථකව පවත්වන ලදී. හඳුනාගත් සංගණන කාණ්ඩ තුළ පවතින ගොඩනැගිලි සහ සංගණන ඒකක වර්ගීකරණය කිරීම, හා ඒවා සඳහා අනන්‍ය ලෙස හඳුනාගත හැකි අංක ලබාදීම ලැයිස්තුගත කිරීමේ අදියරේදී සිදුවිය. තෙවන අදියර; තොරතුරු රැස්කිරීමේ අදියර එනම් පුද්ගලයන් සහ ඔවුන්ගේ වාසස්ථාන ගණන් ගැනීමේ අදියර 2024 සිව්වන කාර්තුවේදී සිදුවනු ඇත. පහළොස්වන ජන හා නිවාස සංගණනයේ ගණන් ගැනීමේ අදියර 2021 වර්ෂයේදී සිදුකිරීමට නියමිතව තිබුනද කෝවිඩ් 19 වසංගතය හා ඉන්පසුව රටෙහි ඇතිවූ ආර්ථික ගැටලු හේතුවෙන් එය 2024 දක්වා කල් දැමීමට සිදුවිය. ඒ අනුව තෙවන අදියරේදී, ලැයිස්තුගත කිරීමේදී සකස් කරන ලද සංගණන ඒකක ලැයිස්තුව භාවිත කරමින් පුද්ගල, ගෘහ කාණ්ඩ සහ නිවාස තොරතුරු රැස් කරනු ලබන අතර සකස් කළ සංගණන ඒකක ලැයිස්තුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිල සංඛ්‍යාලේඛන ලබා දීම සඳහා සිදුකරනු ලබන ඉදිරි සංගණන සහ සමීක්ෂණ සඳහා සංගණන/නියැදි රාමුව ලෙසද භාවිතා කරනු ලබයි. සිව්වන අදියර; සංගණනයේ දත්ත නිකුත් කිරීම, 2025 පළමු භාගයේදී සිදුකර අවසන් කිරීමට නියමිතය.

මෙම මූලික වාර්තාව 2023 ඔක්තෝබර් සිට 2024 ජනවාරි දක්වා සිදු වූ ජන හා නිවාස සංගණනයේ ලැයිස්තුගත කිරීමේ අදියරේදී එකතු කරන ලද දත්ත මත පදනම් වේ. ලැයිස්තුගත කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධානම අංගය වනුයේ ගොඩනැගිලි සහ ඒවා තුල පවතින "සංගණන ඒකක" හඳුනා ගැනීම සහ වර්ගීකරණය කිරීමයි. ගොඩනැගිල්ලක් යනු වහලයකින් සහ බිත්ති හතරකින් වටකර ඇති, පොළොව මත ගොඩනගා ඇති ව්‍යුහයකි. මෙවර ලැයිස්තුගත කිරීමේදී ගොඩනැගිල්ලක් හඳුනාගනිමින් ඒ තුළ ඇති සෑම සංගණන ඒකකයකටම අනන්‍ය අංකයක් ලබා දෙන ලදී. පෙර සංගණනවලදී, ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක් වෙනම "සංගණන ඒකකයක්" ලෙස

[1] Principles and Recommendations for Population and Housing Censuses, Revision 3 https://doi.org/10.18356/bb3ea73e-en

හඳුනාගනිමින් ඒ සඳහා සංගණන ලේබල නිකුත් කරන ලදී. එහිදී මෙවර මෙන් මූලිකව ගොඩනැගිල්ල හඳුනාගැනීමේ ක්‍රියාවලිය සිදු නොවුනි. වත්මන් සංගණනයේ සංගණන ඒකක හඳුනා ගැනීමට භාවිතා කරන සංකල්ප සහ නිර්වචන පෙර සංගණනවල භාවිතා වූ ඒවාට අනුකූල වන අතර යම් වෙනසක් ඇති විට, දත්ත පරිශීලකයින්ගේ සහාය සඳහා නිශ්චිත සටහන් ලබා දෙනු ලැබේ. ඒ අනුව, මෙම වාර්තාවේ සඳහන් පරිදි සංසන්දනාත්මක සංඛ්‍යාලේඛන ලබාදීමට භාවිතා කර ඇත්තේ 1981 සහ 2012 සංගණන වර්ෂයන්ට අදාල ජන හා නිවාස සංගණනවල ගොඩනැගිලි ලැයිස්තුගත කිරීමේ සාරාංශ ලේඛන වලින් ලබාගත් සංඛ්‍යාලේඛන වේ.

## ශ්‍රී ලංකාවේ පරිපාලන ව්‍යුහය

ශ්‍රී ලංකාව පළාත් නවයකට බෙදා ඇති අතර, සෑම පළාතක්ම පරිපාලන දිස්ත්‍රික්ක කිහිපයකින් සමන්විත වේ. සෑම පරිපාලන දිස්ත්‍රික්කයක්ම තවදුරටත් ප්‍රාදේශීය ලේකම් (ප්‍රා.ලේ.) කොට්ඨාශ වලට බෙදා ඇත. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නැවත ග්‍රාම නිලධාරි කොට්ඨාස වලට බෙදා වෙන් කර ඇති අතර මෙම පරිපාලන ඒකකය කුඩාම පරිපාලන ඒකකය ලෙස ක්‍රියාත්මක වේ. ඒ අනුව රටෙහි පරිපාලන දිස්ත්‍රික්ක 25ක් පවතින අතර මේ වන විට ක්‍රියාත්මක ප්‍රා.ලේ. කොට්ඨාස ගණන 340 කි. 2012 සංගණනයේදී වාර්තා වූ ප්‍රා.ලේ. කොට්ඨාස සංඛ්‍යාව 331කි. මෙම ප්‍රා.ලේ. කොට්ඨාස සංඛ්‍යාවේ වෙනස් වීම, 2019 ඔක්තෝම්බර් 29 වැනි දින නිකුත් කරන ලද අංක 2147/28 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සිදු කරන ලද සංශෝධනයන්ට අනුව සිදුවී ඇති අතර පෙර 331 ක්ව පැවති ප්‍රා.ලේ. කොට්ඨාස සංඛ්‍යාව 340ක් ලෙස සංශෝධනය වී ඇත. ඒ අනුව, නුවරඑළිය දිස්ත්‍රික්කයේ පෙර පැවති ප්‍රා.ලේ. කොට්ඨාස පහ ප්‍රා.ලේ. කොට්ඨාස දහයක් ලෙස ස්ථාපනය කිරීම, ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව ප්‍රා.ලේ. කොට්ඨාසය, නව ප්‍රා.ලේ. කොට්ඨාස තුනකට බෙදා වෙන් කිරීම, ගාල්ල දිස්ත්‍රික්කයේ බද්දේගම ප්‍රා.ලේ. කොට්ඨාසය, නව ප්‍රා.ලේ. කොට්ඨාස තුනකට බෙදා වෙන් කිරීම සහ රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රා.ලේ. කොට්ඨාසය, ප්‍රා. ලේ. කොට්ඨාස දෙකකට බෙදා වෙන් කිරීම නිසා මුළු ප්‍රා. ලේ. කොට්ඨාස ගණන 340 ක් වී ඇත.

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම නැවත ග්‍රාම නිලධාරි කොට්ඨාස වලට බෙදා වෙන් කර ඇති අතර 2012 සංගණන අවස්ථාවේ දී ග්‍රාම නිලධාරි කොට්ඨාස ගණන 14,021කි. කෙසේවුවද ඉන් පසුව රට තුළ ක්‍රියාත්මක වූ විවිධ ව්‍යාපෘති හේතුවෙන් භූමියෙහි සිදු වූ වෙනස්කම් සමග මෙම සංඛ්‍යාව සංශෝධනය වී දැනට රට තුළ ක්‍රියාත්මක ග්‍රාම නිලධාරි කොට්ඨාස ගණන 14,008 ක් වී ඇත. මොරගහකන්ද ව්‍යාපෘතිය හේතුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල ප්‍රා.ලේ. කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස පහකද, කළු ගඟ ව්‍යාපෘතිය හේතුවෙන් එම දිස්ත්‍රික්කයේ ලග්ගල පල්ලේගම ප්‍රා.ලේ. කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස අටකද භූමි ප්‍රදේශයන් ජලයට යටවීම හේතුවෙන් එම දිස්ත්‍රික්කයේ 545 ක්ව පැවැති ග්‍රාම නිලධාරි කොට්ඨාස ගණන 532 ක් ලෙස සංශෝධනය වීම මෙසේ මුළු ග්‍රාම නිලධාරි කොට්ඨාස ගණන සංශෝධනය වීමට හේතු වී ඇත.

රටෙහි නාගරික අංශය මහ නගර සභා සහ නගර සභා වලින් සමන්විත වේ. ඒ අතරින් මහනගර සභා 23 ක් දිස්ත්‍රික්ක පහළොවක් තුල ද, නගර සභා 41ක් දිස්ත්‍රික්ක දහනවයක් තුලද ස්ථාපනය වී ඇත. මහ නගර සභා විසි තුනෙන් පහක් ම සහ නගර සභා හතලිස් එකෙන් පහක් ම දිවයිනේ වැඩිම ජන ඝනත්වය ඇති කොළඹ දිස්ත්‍රික්කය තුල ස්ථාපනය වී තිබීම විශේෂත්වයක් ලෙස හැඳින්විය හැක. මහ නගර සභා සහ නගර සභා හැරුණු විට දිවයිනේ ඉතිරි ප්‍රදේශ ආවරණය කරනු ලබන ප්‍රාදේශීය සභා සංඛ්‍යාව 271 ක් වේ. දිස්ත්‍රික්ක අනුව පරිපාලන කොට්ඨාසවල විසිරීම වගුව 01 න් පෙන්නුම් කෙරේ.

මෙයට අමතරව රට තුළ ක්‍රියාත්මක පරිපාලන මැතිවරණ දිස්ත්‍රික්ක ගණන 22 කි. පරිපාලන දිස්ත්‍රික්ක 25 සමග සැසැඳීමේ දී දක්නට ලැබෙන වෙනස වනුයේ උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක 5 අතුරින් යාපයන හා කිලනොච්චි දිස්ත්‍රික්කයන් 2 එක්කොට යාපනය මැතිවරණ දිස්ත්‍රික්කය සකස් වීමත්, පරිපාලන දිස්ත්‍රික්කයන් වන වව්නියාව, මුලතිව් හා මන්නාරම යන දිස්ත්‍රික්කයන් 3 එක් වී වන්නි මැතිවරණ දිස්ත්‍රික්කය සකස් වීමත් හේතුවෙන් පරිපාලන දිස්ත්‍රික්ක 5 පරිපාලන මැතිවරණ දිස්ත්‍රික්ක 2 ක් බවට පත්වීමය. මෙයට අමතරව අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය මැතිවරණ දිස්ත්‍රික්කයක් ලෙස සැලකීමේ දී එය දිගාමඩුල්ල පරිපාලන මැතිවරණ දිස්ත්‍රික්කය ලෙස නම්කර ඇත.

වගුව 01: දිස්ත්‍රික්ක අනුව ශ්‍රී ලංකාවේ පරිපාලන කොට්ඨාස වල ව්‍යාප්තිය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | ග්‍රාම නිලධාරී කොට්ඨාස | මහ නගර සභා | නගර සභා | ප්‍රාදේශීය සභා | ඡන්ද ප්‍රදේශ |
|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | 340 | 14,008 | 24 | 41 | 276 | 160 |
| කොළඹ | 13 | 557 | 5 | 5 | 3 | 15 |
| ගම්පහ | 13 | 1177 | 2 | 5 | 12 | 13 |
| කළුතර | 14 | 762 | - | 4 | 13 | 8 |
| මහනුවර | 20 | 1187 | 1 | 4 | 17 | 13 |
| මාතලේ | 11 | 532 | 2 | - | 11 | 4 |
| නුවරඑළිය | 10 | 491 | 1 | 2 | 9 | 4 |
| ගාල්ල | 22 | 895 | 1 | 2 | 17 | 10 |
| මාතර | 16 | 650 | 1 | 1 | 14 | 7 |
| හම්බන්තොට | 12 | 576 | 1 | 1 | 10 | 4 |
| යාපනය | 15 | 435 | 1 | 3 | 13 | 10 |
| මන්නාරම | 5 | 153 | - | 1 | 4 | 1 |
| වවුනියාව | 4 | 102 | - | 1 | 4 | 1 |
| මුලතිවු | 6 | 136 | - | - | 5 | 1 |
| කිළිනොච්චිය | 4 | 95 | - | - | 3 | 1 |
| මඩකලපුව | 14 | 346* | 1 | 2 | 9 | 3 |
| අම්පාර | 20** | 503 | 2 | 1 | 17 | 4 |
| ත්‍රිකුණාමලය | 11 | 230 | - | 2 | 11 | 3 |
| කුරුණෑගල | 30 | 1610 | 1 | 1 | 19 | 14 |
| පුත්තලම | 16 | 548 | - | 2 | 10 | 5 |
| අනුරාධපුරය | 22 | 694 | 1 | - | 18 | 7 |
| පොළොන්නරුව | 7 | 295 | 1 | - | 7 | 3 |
| බදුල්ල | 15 | 567 | 2 | 1 | 15 | 9 |
| මොණරාගල | 11 | 319 | - | - | 10 | 3 |
| රත්නපුරය | 18 | 575 | 1 | 2 | 14 | 8 |
| කෑගල්ල | 11 | 573 | - | 1 | 11 | 9 |

* මඩකලපුව දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස ගණන 346 ක් ලෙස දැක්වුවද භූමියෙහි පවතින ග්‍රාම නිලධාරී කොට්ටාස ගණන 345 කි. පුනායි නැගෙණහිර ග්‍රා.නි. කොට්ඨාසය (211බී) කෝරලෙයි පත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ස්ථිරව අයත් වේ. පුනායි නැගෙණහිර ග්‍රා.නි. කොට්ඨාසය (211බී) ට අයත් රිදීතැන්න හා ජයන්තියාය ග්‍රාමයන් තාවකාලිකව කෝරලෙයිපත්තු මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටතේ ක්‍රියාත්මක වේ. එම භූමි කොටස සංඛ්‍යාලේඛන සකස් කිරීමේදී වෙනම ග්‍රාම නිලධාරී කොට්ඨාසයක් ලෙස සලකා කටයුතු කර ඇති හෙයින් ග්‍රා.නි. කොට්ඨාස සංඛ්‍යාව 346 වේ.

** සදහන් කර ඇති මුළු ප්‍රා.ලේ. සංඛ්‍යාව (20) තුල කල්මුණේ උතුර උප ප්‍රා. ලේ. කාර්‍යාලයද ඇතුලත් වේ.

## සංගණන ඒකක වර්ගීකරණය

2024 වසරේදී පැවැත්වෙන පහළොස්වන ජන හා නිවාස සංගණනයේ සංකල්ප හා අර්ථ දැක්වීම් 2020 සංගණන වටයට අදාලව එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් ජන හා නිවාස සංගණන සම්බන්ධයෙන් ප්‍රකාශිත මාර්ගෝපදේශයන් භාවිතා කරමින් සකස්කරනු ලැබිය[2]. මෙම සංකල්ප හා අර්ථදැක්වීම් ලෝකයේ අනෙකුත් රටවල් සඳහාද යොදාගනු ලබන හෙයින් මෙම සංඛ්‍යාලේඛන ජාත්‍යන්තරව සැසඳිය හැකිවේ. ඒ අනුව පෙර සංගණනයන් වලදී භාවිතා කරනු ලැබූ යම් යම් සංකල්ප හා අර්ථදැක්වීම්වල සුළු වෙනස්කම් සිදුව තිබිය හැකි අතර දක්වා ඇති සංඛ්‍යාලේඛන භාවිතයේදී එම වගුවල සටහන් ලෙස ලබාදී ඇති කරුණු පිළිබඳව සැළකිලිමත් විය යුතුවේ. 2012 හා 1981 ජන හා නිවාස සංගණනවල ලැයිස්තුගත කිරීමේ කාර්යයේදී දිවයිනේ පිහිටි සියලුම ගොඩනැගිලි, **‘නිවාස ඒකක’**, **‘සමූහ වාසස්ථාන’** හා **‘වාසය සඳහා නොවන ස්ථාන’** යනුවෙන් වර්ග තුනක් යටතේ වර්ග කර ඇත. එහෙත් 2024 ජන හා නිවාස සංගණනයේ ලැයිස්තුගත කිරීමේ කාර්යයේ දී පෙර පැවති සමූහ වාසස්ථාන නැමති ඒකක වර්ගය සමූහ වාසස්ථාන සහ නේවාසික ආයතන ලෙස ඒකක වර්ග දෙකකට බෙදා ලැයිස්තුගත කර ඇත. ඒ අනුව මෙවර ලැයිස්තුගත කිරීමේ දී දිවයිනේ පිහිටි සියලුම ගොඩනැගිලි තුල ඇති සංගණන ඒකක **‘නිවාස ඒකක’**, **‘සමූහ වාසස්ථාන’**, **‘නේවාසික ආයතන’** සහ **‘වාසය සඳහා නොවන ස්ථාන’** යනුවෙන් වර්ග හතරක් යටතේ වර්ග කෙරිණි.

මෙම වර්ගීකරණයේදී, අනෙකුත් ඒකකවලින් වෙන්වූ ඇතුලු වීම සඳහා වෙනම දොරටුවක් සහිත මිනිසුන්ගේ වාසය සඳහා වූ ස්ථාන **‘නිවාස ඒකක’** ලෙස වර්ග කරන ලදී. නිවාස ඒකක තුල ගෘහ කාණ්ඩ හඳුනාගනු ලබන අතර බොහෝවිට එකිනෙකාට නෑදෑකමක් ඇති පුද්ගලයින් පදිංචි වී සිටියි. තවද, මෙම ලැයිස්තුගත කිරීමේ අදියරේදී, නිවාස ඒකකයක් ලෙස සැලකීමේ නිර්ණායක තුන සපුරාලන ස්ථාන සහ එකෙනෙකාට නෑදෑකමක් නොමැති පුද්ගලයින් හතර දෙනෙකු දක්වා එකට ජීවත් වන ස්ථාන ද 'නිවාස ඒකක' ලෙස වර්ගීකරණය කර ඇත.

වෙනත් ඒකකවලින් වෙන් වූ, එකිනෙකාට නෑදෑකමක් නොමැති පුද්ගලයන් පස් දෙනෙකු හෝ වැඩි ගණනක් එකට ජීවත් වන ස්ථාන, 'සමූහ වාසස්ථාන' ලෙස වර්ග කර ඇත. මේ යටතේ රෝගීන් දිගු කාලයක් රැඳී සිටින රෝහල් හැර අනෙකුත් සියළු රෝහල්, සංචාරක හෝටල්, බෝඩිං කාමර හෝ චමරි ඇතුළත් වේ. කෙසේ වෙතත්, ජන හා නිවාස සංගණනය 2012 සහ ඊට පෙර, එකිනෙකාට නෑදෑකමක් නොමැති පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පදිංචි ස්ථාන 'සමූහ වාසස්ථාන' ලෙස වර්ග කර ඇත.

සමූහ වාස්ස්ථානවල විශේෂ අවස්ථාවක් වන ‘නේවාසික ආයතන’ පොදු හෝ පුද්ගලික කර්තව්‍යයක් හා බැඳුණු පුද්ගලයින් සමූහයක් මූලික පාලකයෙකුගේ පරිපාලනය යටතේ එකට පදිංචි වී සිටින ස්ථානයකි. මේ යටතේ පොලිස් හා හමුදා බැරැක්ක, නේවාසිකාගාර, වැඩිහිටි නිවාස, ළමා නිවාස, ආබාධිතයින් සඳහා වූ ආයතන, රෝගීන් දිගුකාලීනව පදිංචිව සිටින මානසික රෝහල, ලාදුරු රෝහල, පුනරුත්තාපන රෝහල්, සිර කඳවුරු, පුනරුත්තාපන කඳවුරු, බන්ධනාගාර, සංඝාවාස, මඩම් ඇතුළු සියලුම ආගම්වල පූජ්‍ය/ පූජකයින් ලැගුම්ගන්නා ස්ථාන පමණක් සළකනු ලැබේ.

මෙම ඒකක තුන්වර්ගයට ම අයත් නොවන කඩ සාප්පු, වෙළඳ සැල්, කාර්යාල ගොඩනැගිලි, තෙල් පිරවුම්හල්, පාසල් ගොඩනැගිලි, ආගමික ගොඩනැගිලි ආදිය ‘වාසය සඳහා නොවන ස්ථාන’ ලෙස වර්ග කරන ලදී.

ඉහත සඳහන් කළ පරිදි වර්ග කෙරුණු ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක්, එකම කාර්යය සඳහා යොදා ගෙන ඇති ගොඩනැගිලි කිහිපයක් ‘ගොඩනැගිලි ඒකකයක්’ ලෙස 2012 හා ඊට පෙර හඳුන්වන ලද අතර 2024 සංගණනයේදී එසේ වර්ග කරනු ලබන ඒකක ‘සංගණන ඒකකයක්’ ලෙස හඳුන්වයි. සංකල්පමය වශයෙන් වෙනස්කමක් නොමැති හෙයින් මෙතැන් සිට සංගණන ඒකක ලෙස හඳුන්වමින් විස්තර කිරීම සිදුකෙරෙනු ඇත.

---

[2] Principles and Recommendations for Population and Housing Censuses, Revision 3
https://doi.org/10.18356/bb3ea73e-en

ඒ අනුව 2024 ජන හා නිවාස සංගණනයේ ලැයිස්තුගත කිරීමේදී වාර්තා වී ඇති රටෙහි මුළු සංගණන ඒකක සංඛ්‍යාව 8,377,895 කි (වගුව 02). මෙම සංඛ්‍යාව 1981 දී 3,423,486 සිට මේ දක්වා වූ වසර 42 තුල දෙගුණයකට වඩා වැඩි ප්‍රමාණයකින් එනම් සියයට 144.7 කින් වැඩිවී ඇත.

වගුව 02: ඒකක වර්ගය හා සංගණන වර්ෂ අනුව සංගණන ඒකක ව්‍යාප්තිය 1981, 2012 සහ 2024

<table>
<tr><th rowspan="2">ඒකක වර්ගය</th><th colspan="2">1981</th><th colspan="2">2012</th><th colspan="2">2024</th></tr>
<tr><th>සංඛ්‍යාව</th><th>%</th><th>සංඛ්‍යාව</th><th>%</th><th>සංඛ්‍යාව</th><th>%</th></tr>
<tr><td>මුළු සංගණන ඒකක*</td><td>3,423,486</td><td>100.0</td><td>6,769,131</td><td>100.0</td><td>8,377,895</td><td>100.0</td></tr>
<tr><td>නිවාස ඒකක</td><td>2,943,610</td><td>86.0</td><td>5,773,678</td><td>85.3</td><td>6,762,644</td><td>80.7</td></tr>
<tr><td>සමූහ වාසස්ථාන**</td><td rowspan="2">80,140</td><td rowspan="2">2.3</td><td rowspan="2">69,805</td><td rowspan="2">1.0</td><td>46,376</td><td>0.6</td></tr>
<tr><td>නේවාසික ආයතන</td><td>57,186</td><td>0.7</td></tr>
<tr><td>වාසය සඳහා නොවන ස්ථාන</td><td>399,736</td><td>11.7</td><td>925,648</td><td>13.7</td><td>1,511,689</td><td>18.0</td></tr>
</table>

* 2012 ට පෙර ගොඩනැගිලි ඒකක ලෙස දක්වා ඇත.

** 2024 දී නිවාස ඒකකයක් ලෙස සැලකීමට සපුරාලිය යුතු අවශ්‍යතා ත්‍රිත්වය සපුරාලන සහ එකිනෙකට නෑකමක් නැති පුද්ගලයින් උපරිම වශයෙන් හතරදෙනෙකු දක්වා එකට පදිංචිව සිටින ස්ථාන ‘නිවාස ඒකක’ වර්ගය යටතටත්, එකිනෙකාට නෑදෑකමක් නොමැති පුද්ගලයන් පස් දෙනෙකු හෝ වැඩි ගණනක් එකට ජීවත් වන ස්ථාන, 'සමූහ වාසස්ථාන' ලෙසත් වර්ග කර ඇත. 2012 සහ ඊට පෙර, එකිනෙකාට නෑදෑකමක් නොමැති පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පදිංචි ස්ථාන 'සමූහ වාසස්ථාන' ලෙස වර්ග කර ඇත.

රටෙහි මුළු සංගණන ඒකක සංඛ්‍යාවෙන් බහුතරය නිවාස ඒකක වේ. එම සංඛ්‍යාව පෙර සංගණනවල දී මෙන්ම 2024 ජන හා නිවාස සංගණනයේදී ද මුළු සංගණන ඒකක සංඛ්‍යාවෙන් හතරෙන් තුනකට වඩා වැඩිවේ. මෙවර රටෙහි මුළු නිවාස ඒකක සංඛ්‍යාව 6,762,644ක් වන අතර, ප්‍රතිශතයක් ලෙස එය දිවයිනේ මුළු ලැයිස්තුගත කරන ලද සංගණන ඒකක සංඛ්‍යාවෙන් සියයට 80.7කි. එම ප්‍රතිශතය 2012 සංගණනයේ දී සියයට 85.0 ක් විය.

2012 සංගණනයේදී වාර්තාවන 925,648 ක් වූ වාසය සඳහා නොවන ස්ථාන සංඛ්‍යාව 2024 සංගණනයේදී 1,511,689 දක්වා සියයට 63.3 කින් වැඩිවී ඇත. මේ අනුව 2012 සංගණනයේදී මුළු සංගණන ඒකක සංඛ්‍යාවෙන් සියයට 13.7ක් වූ වාසය සඳහා නොවන ස්ථාන සංඛ්‍යාව 2024 සංගණනයේදී මුළු සංගණන ඒකක සංඛ්‍යාවෙන් සියයට 18.0 ක් ලෙස වැඩිවී ඇත.

## දිස්ත්‍රික්ක අනුව මුළු සංගණන ඒකකවල ව්‍යාප්තිය

මෙවර සංගණන ඒකක සංඛ්‍යාවේ විසිරීම දිස්ත්‍රික්ක මට්ටමින් සලකා බැලූ කළ පෙනීයනුයේ ලැයිස්තුගතව ඇති මුළු සංගණන ඒකක සංඛ්‍යාවෙන් හතරෙන් එකකට ආසන්න ප්‍රමාණයක් පිහිටන්නේ බස්නාහිර පළාතට අයත් කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල බවය. තවද, උතුරු පළාතට අයත් දිස්ත්‍රික්කවලින් සාපේක්ෂව අඩු සංගණන ඒකක ප්‍රමාණයක් පෙන්නුම් කරයි.

පහත වගු අංක 03 න් දිස්ත්‍රික්ක හා සංගණන ඒකක වර්ගය අනුව සංගණන ඒකකවල විසිරීම පෙන්වයි.

වගුව 03: දිස්ත්‍රික්ක අනුව සංගණන ඒකක වර්ගය සහ ඒකක වල ව්‍යාප්තිය - 2024

| දිස්ත්‍රික්කය | මුළු ගණන | | නිවාස ඒකක | | සමූහ වාසස්ථාන | | නේවාසික ආයතන | | වාසය සඳහා නොවන ස්ථාන | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| ශ්‍රී ලංකාව | 8,377,895 | 100 | 6,762,644 | 80.7 | 46,376 | 0.6 | 57,186 | 0.7 | 1,511,689 | 18.0 |
| කොළඹ | 931,589 | 100 | 751,585 | 80.7 | 6,833 | 0.7 | 7,277 | 0.8 | 165,894 | 17.8 |
| ගම්පහ | 939,135 | 100 | 770,132 | 82.0 | 3,158 | 0.3 | 7,417 | 0.8 | 158,428 | 16.9 |
| කළුතර | 469,590 | 100 | 385,987 | 82.2 | 1,626 | 0.3 | 3,012 | 0.6 | 78,965 | 16.8 |
| මහනුවර | 529,850 | 100 | 434,327 | 82.0 | 2,002 | 0.4 | 3,610 | 0.7 | 89,911 | 17.0 |
| මාතලේ | 208,108 | 100 | 166,819 | 80.2 | 2,951 | 1.4 | 1,478 | 0.7 | 36,860 | 17.7 |
| නුවරඑළිය | 258,326 | 100 | 217,615 | 84.2 | 1,997 | 0.8 | 1,069 | 0.4 | 37,645 | 14.6 |
| ගාල්ල | 423,933 | 100 | 338,594 | 79.9 | 5,834 | 1.4 | 3,184 | 0.8 | 76,321 | 18.0 |
| මාතර | 316,626 | 100 | 257,817 | 81.4 | 3,298 | 1.0 | 2,090 | 0.7 | 53,421 | 16.9 |
| හම්බන්තොට | 260,218 | 100 | 208,561 | 80.1 | 2,363 | 0.9 | 1,426 | 0.5 | 47,868 | 18.4 |
| යාපනය | 233,108 | 100 | 186,925 | 80.2 | 919 | 0.4 | 1,030 | 0.4 | 44,234 | 19.0 |
| මන්නාරම | 49,460 | 100 | 38,999 | 78.8 | 219 | 0.4 | 100 | 0.2 | 10,142 | 20.5 |
| වවුනියාව | 73,631 | 100 | 58,577 | 79.6 | 281 | 0.4 | 427 | 0.6 | 14,346 | 19.5 |
| මුලතිවු | 50,936 | 100 | 39,728 | 78.0 | 153 | 0.3 | 723 | 1.4 | 10,332 | 20.3 |
| කිළිනොච්චිය | 54,175 | 100 | 42,200 | 77.9 | 239 | 0.4 | 275 | 0.5 | 11,461 | 21.2 |
| මඩකලපුව | 230,368 | 100 | 186,155 | 80.8 | 748 | 0.3 | 1,203 | 0.5 | 42,262 | 18.3 |
| අම්පාර | 286,385 | 100 | 222,586 | 77.7 | 1,405 | 0.5 | 1,498 | 0.5 | 60,896 | 21.3 |
| ත්‍රිකුණාමලය | 168,772 | 100 | 130,713 | 77.4 | 868 | 0.5 | 1,547 | 0.9 | 35,644 | 21.1 |
| කුරුණෑගල | 700,183 | 100 | 561,823 | 80.2 | 1,309 | 0.2 | 3,977 | 0.6 | 133,074 | 19.0 |
| පුත්තලම | 332,627 | 100 | 267,338 | 80.4 | 1,693 | 0.5 | 1,820 | 0.5 | 61,776 | 18.6 |
| අනුරාධපුරය | 386,807 | 100 | 301,902 | 78.0 | 2,523 | 0.7 | 4,174 | 1.1 | 78,208 | 20.2 |
| පොළොන්නරුව | 179,425 | 100 | 139,450 | 77.7 | 590 | 0.3 | 2,118 | 1.2 | 37,267 | 20.8 |
| බදුල්ල | 323,139 | 100 | 262,599 | 81.3 | 1,407 | 0.4 | 2,341 | 0.7 | 56,792 | 17.6 |
| මොණරාගල | 210,175 | 100 | 167,510 | 79.7 | 2,100 | 1.0 | 1,449 | 0.7 | 39,116 | 18.6 |
| රත්නපුරය | 432,934 | 100 | 358,909 | 82.9 | 1,351 | 0.3 | 2,227 | 0.5 | 70,447 | 16.3 |
| කෑගල්ල | 328,395 | 100 | 265,793 | 80.9 | 509 | 0.2 | 1,714 | 0.5 | 60,379 | 18.4 |

## දිස්ත්‍රික්ක අනුව නිවාස ඒකක ඒකකවල ව්‍යාප්තිය


දිස්ත්‍රික්ක අනුව නිවාස ඒකක සංඛ්‍යාවේ විසිරීම සලකා බැලීමේ දී පැහැදිලිව පෙනී යන්නේ, අපේක්ෂා කළ හැකි පරිදි වැඩි නිවාස ඒකක සංඛ්‍යාවක් රටෙහි වඩා ජනාකීර්ණ දිස්ත්‍රික්කවලින් වාර්තා වී ඇති බවය. වගුව 04 හි දක්වා ඇති පරිදි වැඩි නිවාස ඒකක සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ බස්නාහිර පළාතේ ගම්පහ (770,132) සහ කොළඹ (751,585) දිස්ත්‍රික්ක වලිනි.

වගුව 04: දිස්ත්‍රික්ක අනුව නිවාස ඒකක වල ව්‍යාප්තිය

| දිස්ත්‍රික්කය | මුළු සංගණන ඒකක | නිවාස ඒකක | | දිස්ත්‍රික්කය තුල නිවාස |
|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | ප්‍රතිශතය |
| ශ්‍රී ලංකාව | 8,377,895 | 6,762,644 | 100.0 | 80.7 |
| කොළඹ | 931,589 | 751,585 | 11.1 | 80.7 |
| ගම්පහ | 939,135 | 770,132 | 11.4 | 82.0 |
| කළුතර | 469,590 | 385,987 | 5.7 | 82.2 |
| මහනුවර | 529,850 | 434,327 | 6.4 | 82.0 |
| මාතලේ | 208,108 | 166,819 | 2.5 | 80.2 |
| නුවරඑළිය | 258,326 | 217,615 | 3.2 | 84.2 |
| ගාල්ල | 423,933 | 338,594 | 5.0 | 79.9 |
| මාතර | 316,626 | 257,817 | 3.8 | 81.4 |
| හම්බන්තොට | 260,218 | 208,561 | 3.1 | 80.1 |
| යාපනය | 233,108 | 186,925 | 2.8 | 80.2 |
| මන්නාරම | 49,460 | 38,999 | 0.6 | 78.8 |
| වවුනියාව | 73,631 | 58,577 | 0.9 | 79.6 |
| මුලතිවු | 50,936 | 39,728 | 0.6 | 78.0 |
| කිළිනොච්චිය | 54,175 | 42,200 | 0.6 | 77.9 |
| මඩකලපුව | 230,368 | 186,155 | 2.8 | 80.8 |
| අම්පාර | 286,385 | 222,586 | 3.3 | 77.7 |
| ත්‍රිකුණාමලය | 168,772 | 130,713 | 1.9 | 77.4 |
| කුරුණෑගල | 700,183 | 561,823 | 8.3 | 80.2 |
| පුත්තලම | 332,627 | 267,338 | 4.0 | 80.4 |
| අනුරාධපුරය | 386,807 | 301,902 | 4.5 | 78.0 |
| පොළොන්නරුව | 179,425 | 139,450 | 2.1 | 77.7 |
| බදුල්ල | 323,139 | 262,599 | 3.9 | 81.3 |
| මොණරාගල | 210,175 | 167,510 | 2.5 | 79.7 |
| රත්නපුරය | 432,934 | 358,909 | 5.3 | 82.9 |
| කෑගල්ල | 328,395 | 265,793 | 3.9 | 80.9 |

වගුව 04 හි සඳහන් පරිදි ප්‍රතිශතයක් ලෙස ගත් කළ රටෙහි මුළු නිවාස සංඛ්‍යාවෙන් සියයට 11.4 ක් ගම්පහ දිස්ත්‍රික්කයෙහිත් කොළඹ දිස්ත්‍රික්කයෙහි සියයට 11.1 ත් පිහිටා ඇත. මෙයට අමතරව කුරුණෑගල (8.3%), මහනුවර (6.4%), කළුතර (5.7%), රත්නපුර (5.3%) සහ ගාල්ල (5.0%) යන දිස්ත්‍රික්කවලින් සියයට පහ හෝ ඊට වැඩි ප්‍රතිශතයක් බැගින් වාර්තා වී ඇත. ඉතිරි සෑම දිස්ත්‍රික්කයකින්ම වාර්තා වී ඇත්තේ දිවයිනේ මුළු නිවාස ඒකක සංඛ්‍යාවෙන් සියයට පහකටත් අඩු ප්‍රතිශතයක් වශයෙනි. රටෙහි අඩු නිවාස සංඛ්‍යාවක් වාර්ථාවන දිස්ත්‍රික්ක ලෙස මුළු නිවාස ඒකක සංඛ්‍යාවෙන් සියයට එකකටත් අඩු ප්‍රතිශත උතුරු පළාතේ වවුනියාව (0.9%), මුලතිව් (0.6%), කිළිනොච්චි (0.6%) මන්නාරම (0.6%) යන දිස්ත්‍රික්ක දැක්විය හැකිය.

වාර්තාවන නිවාස ඒකක ප්‍රමාණය දිස්ත්‍රික්කයේ මුළු සංගණන ඒකක සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස සැලකූවිට වැඩි ම නිවාස ඒකක ප්‍රතිශතය (84.2 %) වාර්තා වී ඇත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙනි. එලෙසම අඩුම නිවාස ඒකක ප්‍රතිශතයක් වාර්තා වී ඇත්තේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙනි (77.4%).




රූප සටහන 01: දිස්ත්‍රික්ක අනුව මුළු සංගණන ඒකක සහ නිවාස ඒකක සංඛ්‍යාව

## නිවාස ඒකක සංඛ්‍යාවේ වැඩිවීම

2024 සංගණනයේදී වාර්තා වූ නිවාස ඒකක ප්‍රමාණය 2012 සංගණනයේදී වාර්තා වූ ප්‍රමාණය හා සංසන්දනය කිරීමේ දී සියයට දාහතක වර්ධනයක් පෙන්වයි. නිවාස ඒකක ප්‍රමාණය වැඩි වීමේ ශීඝ්‍රතාවයෙහි වැඩිම අගය වාර්තා වී ඇත්තේ මුලතිවු දිස්ත්‍රික්කයෙන් වන අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 100.3 කි (වගුව 05). ඉන්පසු පිළිවෙලින් වැඩිම අගයන් වාර්තා වනුයේ මන්නාරම දිස්ත්‍රික්කයෙන් (47.6%) සහ කිළිනොච්චි දිස්ත්‍රික්කයෙනි (42.8%). 2012 ට සාපේක්ෂව නිවාස ඒකක ප්‍රමාණය වැඩි වීමේ ශීඝ්‍රතාවයේ අඩුම අගයන් වාර්තා වී ඇත්තේ ගාල්ල (9.8%) දිස්ත්‍රික්කයෙනි. ඉහත සඳහන් කළ දිස්ත්‍රික්ක හැරුණු විට අනෙකුත් සියලුම දිස්ත්‍රික්කයන්හි පසුගිය වසර 12 තුල නිවාස ඒකක ප්‍රමාණය වැඩි වීම සියයට 10 ත් සියයට 25 ත් අතර අගයක් ගෙන ඇත.

වගුව 05: දිස්ත්‍රික්ක අනුව නිවාස සංඛ්‍යාවේ වැඩිවීම 2012-2023

| දිස්ත්‍රික්කය | සංගණන වර්ෂ අනුව නිවාස ඒකක සංඛ්‍යාව | | සංගණන අතර වැඩිවීම |
|---|---|---|---|
| | 2024 | 2012 | |
| ශ්‍රී ලංකාව | 6,762,644 | 5,773,678 | 17.1 |
| කොළඹ | 751,585 | 631,749 | 19.0 |
| ගම්පහ | 770,132 | 646,907 | 19.0 |
| කළුතර | 385,987 | 331,354 | 16.5 |
| මහනුවර | 434,327 | 378,296 | 14.8 |
| මාතලේ | 166,819 | 140,818 | 18.5 |
| නුවරඑළිය | 217,615 | 197,903 | 10.0 |
| ගාල්ල | 338,594 | 308,298 | 9.8 |
| මාතර | 257,817 | 230,535 | 11.8 |
| හම්බන්තොට | 208,561 | 174,788 | 19.3 |
| යාපනය | 186,925 | 154,737 | 20.8 |
| මන්නාරම | 38,999 | 26,428 | 47.6 |
| වවුනියාව | 58,577 | 51,313 | 14.2 |
| මුලතිවු | 39,728 | 19,839 | 100.3 |
| කිළිනොච්චිය | 42,200 | 29,549 | 42.8 |
| මඩකලපුව | 186,155 | 152,164 | 22.3 |
| අම්පාර | 222,586 | 183,693 | 21.2 |
| ත්‍රිකුණාමලය | 130,713 | 109,883 | 19.0 |
| කුරුණෑගල | 561,823 | 482,584 | 16.4 |
| පුත්තලම | 267,338 | 228,721 | 16.9 |
| අනුරාධපුරය | 301,902 | 248,014 | 21.7 |
| පොළොන්නරුව | 139,450 | 120,591 | 15.6 |
| බදුල්ල | 262,599 | 232,170 | 13.1 |
| මොණරාගල | 167,510 | 134,057 | 25.0 |
| රත්නපුරය | 358,909 | 318,676 | 12.6 |
| කෑගල්ල | 265,793 | 240,611 | 10.5 |

## දිස්ත්‍රික්ක අනුව සමූහ වාසස්ථානවල ව්‍යාප්තිය

රටෙහි මුළු සමූහ වාසස්ථාන සංඛ්‍යාව 46,376ක් වන අතර, මෙය සමස්ථ සංගණන ඒකක සංඛ්‍යාවෙන් සියයට 0.6 ක් පමණවූ ප්‍රතිශතයකි (වගුව 06). දිස්ත්‍රික්ක අනුව සමූහ වාසස්ථාන සංඛ්‍යාව සලකා බැලූ කළ වැඩිම සමූහ වාසස්ථාන සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කොළඹ (14.7%) දිස්ත්‍රික්කයෙන් සහ දෙවනුවට ගාල්ල (12.6%) දිස්ත්‍රික්කයෙනි. සෙසු සෑම දිස්ත්‍රික්කයකින්ම වාර්තා වී ඇත්තේ සියයට දහයකටත් අඩු ප්‍රතිශත අගයකි. උතුරු පළාතේ  යාපනය දිස්ත්‍රික්කය හැරුනු විට සෙසු දිස්ත්‍රික්ක හතරෙන් ම වාර්තා වී ඇත්තේ සියයට එකකටත් අඩු ප්‍රතිශතයන්ය. එනම් වවුනියාව සියයට 0.6ක් ද කිළිනොච්චි හා මන්නාරම සියයට 0.5 බැගින්ද මුලතිවු සියයට 0.3ක් ද වශයෙනි. යාපනය දිස්ත්‍රික්කයෙන් සියයට දෙකක් වාර්තා වෙයි.

## දිස්ත්‍රික්ක අනුව නේවාසික ආයතනවල ව්‍යාප්තිය

ලැයිස්තුගත කර ඇති මුළු සංගණන ඒකකවලින් සියයට 0.7ක් එනම් 57,186 ක් නේවාසික ආයතන වර්ගයට අයත්වේ (වගුව 06). දිවයිනේ වාර්තා වී ඇති සමස්ථ නේවාසික ආයතන සංඛ්‍යාවෙන් හතරෙන් එකක් පමණ එනම් සියයට 25.7ක් බස්නාහිර පළාතේ ගම්පහ (13.0%) සහ කොළඹ (12.7%) දිස්ත්‍රික්කවලට අයත් වේ. සෙසු දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත්තේ සියයට 10ට වඩා අඩු ප්‍රතිශත අගයකි. සියයට එකකටත් වඩා අඩුවෙන් නේවාසික ආයතන පිහිටා ඇති දිස්ත්‍රික්ක ලෙස වවුනියාව (0.7%), කිළිනොච්චි (0.5%) සහ මන්නාරම (0.2%) දිස්ත්‍රික්ක හඳුනාගත හැකිය.

## දිස්ත්‍රික්ක අනුව වාසය සඳහා නොවන ස්ථානවල ව්‍යාප්තිය


ලැයිස්තුගත කිරීමේ දී වර්ගකර හඳුනාගත් නිවාස ඒකක, සමූහ වාසස්ථාන සහ නේවාසික ආයතන හැරුණු විට, වාසය සඳහා නොවන ස්ථාන ලෙස වර්ග කරන ලද ඉතිරි සංගණන ඒකක 1,511,689 ක් රට පුරා පිහිටා ඇත (වගුව 07). එය ප්‍රතිශතයක් ලෙස දිවයිනේ මුළු සංගණන ඒකක සංඛ්‍යාවෙන් සියයට 18.0 කි. මෙවර කොළඹ (165,894), ගම්පහ (158,428) සහ කුරුණෑගල (133,074) නැමැති දිස්ත්‍රික්ක ත්‍රිත්වයෙන් ම වාසය සඳහා නොවන ස්ථාන ලක්ෂයකට වඩා වැඩි ප්‍රමාණයක් වාර්තා වී ඇත. ඒවා රටෙහි ඇති මුළු වාසය සඳහා නොවන ස්ථාන  සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස ගත් කළ පිළිවෙලින් සියයට 11.0 ක්, සියයට 10.5 ක් හා සියයට 8.8 ක් වේ. අවම වාසය සඳහා නොවන ස්ථාන ප්‍රමාණයක් වාර්තා වන්නේ මන්නාරම දිස්ත්‍රික්කයෙනි.

වගුව 06: දිස්ත්‍රික්ක අනුව සමූහ වාසස්ථාන සහ නේවාසික ආයතන වල ව්‍යාප්තිය

| දිස්ත්‍රික්කය | මුළු සංගණන ඒකක සංඛ්‍යාව | සමූහ වාසස්ථාන | | | නේවාසික ආයතන | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | රට/දිස්ත්‍රික්කය තුල ප්‍රතිශතය | සංඛ්‍යාව | % | රට/දිස්ත්‍රික්කය තුල ප්‍රතිශතය |
| ශ්‍රී ලංකාව | 8,377,895 | 46376 | 100.0 | 0.6 | 57,186 | 100.0 | 0.7 |
| කොළඹ | 931,589 | 6833 | 14.7 | 0.7 | 7,277 | 12.7 | 0.8 |
| ගම්පහ | 939,135 | 3158 | 6.8 | 0.3 | 7,417 | 13.0 | 0.8 |
| කළුතර | 469,590 | 1626 | 3.5 | 0.3 | 3,012 | 5.3 | 0.6 |
| මහනුවර | 529,850 | 2002 | 4.3 | 0.4 | 3,610 | 6.3 | 0.7 |
| මාතලේ | 208,108 | 2951 | 6.4 | 1.4 | 1,478 | 2.6 | 0.7 |
| නුවරඑළිය | 258,326 | 1997 | 4.3 | 0.8 | 1,069 | 1.9 | 0.4 |
| ගාල්ල | 423,933 | 5834 | 12.6 | 1.4 | 3,184 | 5.6 | 0.8 |
| මාතර | 316,626 | 3298 | 7.1 | 1.0 | 2,090 | 3.7 | 0.7 |
| හම්බන්තොට | 260,218 | 2363 | 5.1 | 0.9 | 1,426 | 2.5 | 0.5 |
| යාපනය | 233,108 | 919 | 2.0 | 0.4 | 1,030 | 1.8 | 0.4 |
| මන්නාරම | 49,460 | 219 | 0.5 | 0.4 | 100 | 0.2 | 0.2 |
| වවුනියාව | 73,631 | 281 | 0.6 | 0.4 | 427 | 0.7 | 0.6 |
| මුලතිවු | 50,936 | 153 | 0.3 | 0.3 | 723 | 1.3 | 1.4 |
| කිළිනොච්චිය | 54,175 | 239 | 0.5 | 0.4 | 275 | 0.5 | 0.5 |
| මඩකලපුව | 230,368 | 748 | 1.6 | 0.3 | 1,203 | 2.1 | 0.5 |
| අම්පාර | 286,385 | 1405 | 3.0 | 0.5 | 1,498 | 2.6 | 0.5 |
| ත්‍රිකුණාමලය | 168,772 | 868 | 1.9 | 0.5 | 1,547 | 2.7 | 0.9 |
| කුරුණෑගල | 700,183 | 1309 | 2.8 | 0.2 | 3,977 | 7.0 | 0.6 |
| පුත්තලම | 332,627 | 1693 | 3.7 | 0.5 | 1,820 | 3.2 | 0.5 |
| අනුරාධපුරය | 386,807 | 2523 | 5.4 | 0.7 | 4,174 | 7.3 | 1.1 |
| පොළොන්නරුව | 179,425 | 590 | 1.3 | 0.3 | 2,118 | 3.7 | 1.2 |
| බදුල්ල | 323,139 | 1407 | 3.0 | 0.4 | 2,341 | 4.1 | 0.7 |
| මොණරාගල | 210,175 | 2100 | 4.5 | 1.0 | 1,449 | 2.5 | 0.7 |
| රත්නපුරය | 432,934 | 1351 | 2.9 | 0.3 | 2,227 | 3.9 | 0.5 |
| කෑගල්ල | 328,395 | 509 | 1.1 | 0.2 | 1,714 | 3.0 | 0.5 |

වගුව 07: දිස්ත්‍රික්ක අනුව වාසය සඳහා නොවන ස්ථාන වල ව්‍යාප්තිය

| දිස්ත්‍රික්කය | වාසය සඳහා නොවන ස්ථාන | | |
|---|---|---|---|
| | ඒකක සංඛ්‍යාව | මුළු සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස | දිස්ත්‍රික්කය තුල ප්‍රතිශතය |
| ශ්‍රී ලංකාව | 1,511,689 | 100.0 | 18.0 |
| කොළඹ | 165,894 | 11.0 | 17.8 |
| ගම්පහ | 158,428 | 10.5 | 16.9 |
| කළුතර | 78,965 | 5.2 | 16.8 |
| මහනුවර | 89,911 | 5.9 | 17.0 |
| මාතලේ | 36,860 | 2.4 | 17.7 |
| නුවරඑළිය | 37,645 | 2.5 | 14.6 |
| ගාල්ල | 76,321 | 5.0 | 18.0 |
| මාතර | 53,421 | 3.5 | 16.9 |
| හම්බන්තොට | 47,868 | 3.2 | 18.4 |
| යාපනය | 44,234 | 2.9 | 19.0 |
| මන්නාරම | 10,142 | 0.7 | 20.5 |
| වවුනියාව | 14,346 | 0.9 | 19.5 |
| මුලතිවු | 10,332 | 0.7 | 20.3 |
| කිළිනොච්චිය | 11,461 | 0.8 | 21.2 |
| මඩකලපුව | 42,262 | 2.8 | 18.3 |
| අම්පාර | 60,896 | 4.0 | 21.3 |
| ත්‍රිකුණාමලය | 35,644 | 2.4 | 21.1 |
| කුරුණෑගල | 133,074 | 8.8 | 19.0 |
| පුත්තලම | 61,776 | 4.1 | 18.6 |
| අනුරාධපුරය | 78,208 | 5.2 | 20.2 |
| පොළොන්නරුව | 37,267 | 2.5 | 20.8 |
| බදුල්ල | 56,792 | 3.8 | 17.6 |
| මොණරාගල | 39,116 | 2.6 | 18.6 |
| රත්නපුරය | 70,447 | 4.7 | 16.3 |
| කෑගල්ල | 60,379 | 4.0 | 18.4 |




රූප සටහන 02. දිස්ත්‍රික්කය අනුව සංගණන ඒකක වර්ගය සහ ඒකක ව්‍යාප්තිය
ජන හා නිවාස සංගණනය 2024